**පුරවැසි අධ්‍යාපනය - 1 පත්‍රය පිළිතුරු**

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 11 - 1 | 21 - 2 | 31 - 3 |
| 2 - 3 | 12 - 2 | 22 - 3 | 32 - 2 |
| 3 - 2 | 13 - 3 | 23 - 3 | 33 - 2 |
| 4 - 4 | 14 - 3 | 24 - 3 | 34 - 2 |
| 5 - 4 | 15 - 4 | 25 - 2 | 35 - 2 |
| 6 - 3 | 16 - 2 | 26 - 3 | 36 - 4 |
| 7 - 3 | 17 - 3 | 27 - 3 | 37 - 2 |
| 8 - 1 | 18 - 3 | 28 - 2 | 38 - 4 |
| 9 - 2 | 19 - 3 | 29 - 3 | 39 - 2 |
| 10 - 1 | 20 - 4 | 30 - 4 | 40 - 2 |

**පුරවැසි අධ්‍යාපනය - 11 පත්‍රය පිළිතුරු**

01. i. ස්ත්‍රීන්
    වහලුන්
    විදේශිය වෙළඳුන්

ii. ඒක පක්‍ෂ ක්‍රමය
    ද්වි පක්‍ෂ ක්‍රමය
    බහු පක්‍ෂ ක්‍රමය

iii. විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරන , විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත්වීම.

එක ජන කොටසක වුවද ප්‍රාදේශිය ව විවිධත්වයක් දැකිය හැකි වීම.

ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත් විරිත්, ආචාර ධර්ම හා ඇගයීම් පද්ධතියක් පැවතීම.

ලෝකයේ රටවල් විවිධ ජාතීන් වශයෙන් තම දේශ සීමාවලින් ඔබ්බට ගොස් විවිධ ජාතීන් සමඟ මිශ්‍ර වී බහු සංස්කෘති සමාජ ගොඩ නැගීම.

ලෝකය එක ම වීශ්ව ගම්මානයක් බවට පත් වී සංස්කෘතික සම්මිශ්‍රණය වීම ඉතා වේගයෙන් සිදු වීම.

iv. ඇමරිකා එක්සත් ජනපදය
    ස්විට්සර්ලන්තය
    ඕස්ට්‍රේලියාව

v. තොග වෙළඳාම
    සිල්ලර වෙළඳාම

vi. අධිවේගී මාර්ග ඉදි කිරිම.
වරායන් සහ ගුවන් තොටුපළවල් ඉදි කිරීම
කොළඹ වරාය නගරය ඉදිකිරීම.
නව විදුලි බලාගාර ඉදි කිරීම.
තොරතුරු තාක්‍ෂණය ප්‍රචලිත කිරීම සඳහා තාක්‍ෂණ මධ්‍යස්ථාන ඇති කිරීම
වෘත්තීය හා තාක්‍ෂණ විශ්ව විද්‍යාල පිහිටුවීම.

vii. මහජන සෞඛ්‍ය
පොදු උපයෝගිතා සේවා
පොදු මංමාවත්

viii. අධිකරණ ඇමතිවරයා
අග්‍ර විනිශ්චයකාරවරයා
නීතිපතිතුමා

ix. බේරුම්කරණය
ඔම්බුඩ්ස්මන්වරයා
මානව හිමිකම් කොමිසම

x. මධ්‍යම ආණ්ඩුව
පලාත් සභා
පළාත් පලාන ආයතන

( ලකුණු 2 X 10 = 20 )

02. (i) වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම
වර්තමාන රාජ්‍ය අධික ජනගහනයකින් සමන්විත වීම.
සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුව
සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.

( ලකුණු 1 x 2 = 2 )

ii. ජනතාවගේ මූලික අයිතිවාසිකම් සුරක්‍ෂිත වීම.
නීතියේ රැකවරණය සැමට සමාන ව ලැබීම.
පාලකයන් අත්තනෝමතික ලෙස ක්‍රියා කළහොත් එය වළක්වා ගත හැකි වීම.
පාලනයේ ක්‍රමවත් බව සහ ස්ථාවර බව ආරක්‍ෂා වීම.
අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම.
ජනතා අයිතිවාසිකම් පිළිබඳ පාලක සහ පාලිත දෙපක්‍ෂය ම දැනුවත් වීම.

( ලකුණු 1 x 3 = 3 )

iii. ජනමතයට ඇති ඉඩ කඩ පුළුල් වීම.

අත්තනෝමතික පාලකයන් බිහිවීම වැළැක්වීම.

ජන සමාජයේ පවතින විවිධත්වය නිරූපණය වීමට අවස්ථාව සැලසීම.

බහුවිධතාවය තුළින් එක්සත්භාවය ගොඩ නැගීම.

( කරුණු දැක්වීමට ලකුණු -3, විස්තර කිරීමට ලකුණු - 2 = ලකුණු 5 )

03. i (a) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කෙරෙන රටක් නම් කරන්න.

- බ්‍රිතාන්‍ය
- ඊශ්‍රායලය
- නවසීලන්තය ලකුණු - 1

(b) ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කෙරෙන රටක් නම් කරන්න.

- ඇමරිකා එක්සත් ජනපදය
- ඉන්දියාව
- ශ්‍රී ලංකාව
- ස්විට්සර්ලන්තය ලකුණු - 1

ii. රාජ්‍යයක තිබිය යුතු ප්‍රධාන අංග

- භූමිය
- ජනගහනය
- ආණ්ඩුව
- ස්වාධිපත්‍යය ( ලකුණු 1 x 3 = 3 )

iii (a) ආණ්ඩුවක ප්‍රධාන කොටස් තුන නම් කරන්න.

- ව්‍යවස්ථාදායකය
- විධායකය
- අධිකරණය ( ලකුණු 1 x 3 = 3 )

(b) ඔබ නම් කළ කොටස් තුන අතරින් එක් කොටසකට අයත් කාර්ය භාරය

<u>ව්‍යවස්ථාදායකය</u>

- නීති සම්පාදනය
- නීති පැනවීම.
- විධායකය පාලනය කිරීම
- අයවැය පාලනය
- මූල්‍ය පාලනය
- ප්‍රශ්න ඇසීම
- මහජන දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම
- දෝෂාභියෝග ඉදිරිපත් කිරීම
- විශ්වාසභංග යෝජනා ඉදිරිපත් කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ඉදිරිපත් කිරීම

## විධායකය

- රාජ්‍ය සේවය පාලනය කිරීම
- නියෝග හා ආඥා නිකුත් කිරීම
- ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය පාලනය කිරීම
- විදේශ සම්බන්ධතා පාලනය කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම

## අධිකරණය

- යුක්තිය පසිඳලීම
- නීති විවරණය කිරීම
- පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂකයෙකු ලෙස පෙනී සිටීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයකු ලෙස කටයුතු කිරීම
- උපදේශක කාර්යයන් ඉටු කිරීම

(ඉහත කොටස් තුනෙන් එකක කාර්යභාරය කෙටියෙන් විස්තර කළ කිරීමට ලකුණු -2 )

04. i. රාජ්‍යයක් සතු ව්‍යවස්ථාදායක, විධායක, සහ අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවක් විසින් ක්‍රියාත්මක කරන්නේ නම් එවැනි ආණ්ඩු ඒකීය ආණ්ඩු ක්‍රමයකි. ඒකීය ආණ්ඩු ක්‍රමයක් තුළ කිසිදු බලය බෙදා හැරීමක් සිදු කර නැත. එසේ වුවද පරිපාලන කටයුතු පහසු කරගැනීම වෙනුවෙන් මධ්‍යම ආණ්ඩුවේ සමහර පරිපාලන බලතල පමණක් විමධ්‍යගත කර තිබිය හැකිය.

( මෙවැනි අදහසක් ගම්‍ය වන ආකාරයට සිසුන් විසින් ඉදිරිපත් කර ඇති විස්තරය අනුව ලකුණු ලබා දිය හැකිය.) ( ලකුණු - 2)

ii. භූමි ප්‍රමාණයෙන් විශාල රාජ්‍යයන් වල පරිපාලන තීන්දු ගැනීමට පහසු වීම.
ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාජමුව ශක්තිමත් වීම.
විවිධත්වයක් පවතින සමාජයක් තුළ විවිධත්වයට ගරු කරමින් පොදු ජාතිකත්වයක් ගොඩ නගා ගැනීම.
ප්‍රාන්ත ආණ්ඩු වල ශක්තිමත් ක්‍රියාකාරීත්වය නිසා අත්තනෝමතිකව ක්‍රියාකරන මධ්‍යම ආණ්ඩු සංවරණය වීම.

( ලකුණු 1 x 3 = 3 )

iii. විවිධත්වය තුළ එක්සත්කමක් ගොඩ නගා ගැනීම.
රාජ්‍යයේ විශාලත්වය හේතුවෙන් එක් මධ්‍යස්ථානයක සිට පාලන කටයුතු කිරීමට ඇති අපහසුව
ජාතික ආරක්ෂාව තහවුරු කිරීම.

( කරුණු දැක්වීමට ලකුණු -3, විස්තර කිරීමට ලකුණු - 2 = ලකුණු 5)

05. 1. කුමක් කොපමණ නිෂ්පාදනය කරනවා ද ?

කෙසේ කවුරුන් නිෂ්පාදනය කරනවා ද ?

කවුරුන් සඳහා නිෂ්පාදනය කරනවා ද ?

( ලකුණු 1 x 2 = 2 )

11. ඍණ බාහිරතා කෙරෙහි සැලකිල්ලක නොදැක්වීම.

ලාභ ලැබීමේ අරමුණ මූලික කරගෙන භාණ්ඩ නිපදවීම.

ආර්ථික කටයුතු පෞද්ගලික අයිතිය යටතේ පවතින හෙයින් සම්පත් බෙදී යාමේ අසමානාතාවක් පැවතීම.

විවිධ ප්‍රචාරණ ක්‍රම උපයෝගි කරගෙන භාණ්ඩ අලෙවි කර ගැනිම සඳහා පාරිභෝගිකයාව පොළඹවා ගැනීම

නිෂ්පාදන මිලදී ගැනිමට හැකියාව ඇති පාර්ශ්ව සඳහා භාණ්ඩ නිපදවීම.

( ලකුණු 1 x 3 = 3 )

111. ගෝලීයකරණය නිසා ලංකාවට අත් වී ඇති යහපත් ප්‍රතිපල

- බුද්ධිමතුන් සඳහා විවිධ රැකියා අවස්ථා උදා වීම.
- විදේශිය වෙළඳපොල තුළට කර්මාන්ත යොමු විම නිසා විදේශිය තාක්‍ෂණය හා ආයෝජන ගලා ඒම.
- නව අධ්‍යාපන අවස්ථා ලැබීම
- නිවසේ සිට අන්තර්ජාලය ඔස්සේ ඉගෙන ගැනීමට හැකි විම.
- යටතල පහසුකම් පුළුල් විම සහ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම.
- නව තාක්‍ෂණික හා සන්නිවේදන අංශයේ සීග්‍ර දියුණුව නිසා දෙස් විදෙස් සම්බන්ධතා වැඩි වීම.
- දේශය සම්පත් ප්‍රයෝජනයට ගැනීමේ අවස්ථාව උදාවීම හා සේවා වියුක්තියට විසඳුම් ලැබීම.
- දේශීය කෘෂි නිෂ්පාදන සඳහා නව වෙළඳපොල සොයා ගැනීමට අවස්ථාව ලැබීම.
- දේශීය භාණ්ඩ අපනයන ඉහළ යාම හේතුවෙන් විදේශ විනිමය ලැබීම.
- දේශිය වෙළඳපොලේ නව තාක්‍ෂණික මෙවලම් හා උපකරණ සුලභවීම නිසා දේශිය පරිභෝජන රටාවන් වෙනස් වීම.

( කරුණු දැක්වීමට ලකුණු -3, විස්තර කිරීමට ලකුණු - 2 = ලකුණු 5)

06. 1. ශ්‍රී ලංකාවේ දේශිය නීතියට අමතරව ක්‍රියාත්මක වන වෙනත් නීති වර්ග

- උඩරට නීතිය
- තේසවලාමෙයි නීතිය
- මුසලිම් නීතිය

( ලකුණු 1 x 2 = 2 )

11. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණ ආයතනවලට අමතරව විශේෂ කාර්යයන් පදනම් කර ගෙන පිහිටුවා ඇති අධිකරණ ආයතන

- කම්කරු විනිශ්චය සභා
- කාති උසාවි
- ගෙවල් කුලී මණ්ඩලය
- යුද්ධාධිකරණය

( ලකුණු 1 x 3 = 3 )

111. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්‍ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ගෙන ඇති විධි විධාන

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විනිශ්චයකාරවරුන් පත් කිරීම.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම.
- විනිශ්චයකාරවරුන්ගේ වැටුප් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම හා සේවා කාලය තුළ වැටුප් අඩු කළ නොහැකි වීම.
- විනිශ්චයකාරවරුන්ට වෙනත් ආදායම් ඉපයීමේ කාර්යයක නිරතවිය නොහැකි විම.
- අධිකරණ සේවා කොමිෂන් සභාවක් පත් කිරීම.
- අධිකරණයට අනවශ්‍ය ලෙස මැදිහත් වීම හා බලපෑම් කිරීම දඬුවම් කළ හැකි වරදක් වීම.

( කරුණු දැක්වීමට ලකුණු -3, විස්තර කිරීමට ලකුණු - 2 = ලකුණු 5)

07. i නිදහසට පෙර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දෙකක් නම් කරන්න.

- 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණය
- 1910 කෲ මැකලන් ප්‍රතිසංස්කරණය
- 1922 මැනිං ප්‍රතිසංස්කරණය
- 1924 මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය
- 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

( ලකුණු 1 x 2 = 2 )

**ii** 1978 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව විසින් ඉටු කරන කාර්යයන් තුනක් නම් කරන්න.

- නීති සම්පාදනය / නීති පැනවීම.
- විධායකය පාලනය කිරීම
- අයවැය පාලනය / මූල්‍ය පාලනය
- ප්‍රශ්න ඇසීම
- මහජන දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම
- දෝෂාභියෝග ඉදිරිපත් කිරීම
- විශ්වාසභංග යෝජනා ඉදිරිපත් කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ඉදිරිපත් කිරීම
- අනාගත නායකයින් පුහුණු කිරීම
- නීති සම්මත කිරීම

( ලකුණු 1 x 3 = 3 )

07. iii

- පාර්ලිමේන්තුව කැඳවීම, වාර අවසාන කිරීම, කල් තැබීම හා විසුරුවා හැරීම.
- පාර්ලිමේන්තුවේ පළමු සැසි වාරයේදී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම.
- විශේෂ පනත් කෙටුම්පත් ජනමත විචාරණයකට යොමු කිරීම.
- පාර්ලිමේන්තුව ඇමතීම , සහ සංදේශ යැවීම.
- ජනමත විචාරණයකින් සම්මත වූ පනතක් නීතිගත කිරීම.

( කරුණු දැක්වීමට ලකුණු -3, විස්තර කිරීමට ලකුණු - 2 = ලකුණු 5)